**සිංහල පරිවර්තනය**

**ප.රා.සේ.කො.ස.චක්‍රලේඛ අංක : *12/2021***

මගේ .**NP/07/10/02/181**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
යාපනය.
***17.05.2021***

**ප්‍රධාන ලේකම්,**
ආණ්ඩුකාර ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
උතුරු පළාත

## පළාත් රාජ්‍ය කළමනාකරණ සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2013 (II) 2021

උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද හා 02.04.2013 වන දින සිට බලගැන්වූ උතුරු පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 8 වන ඡේදය හා 15 වන ඡේදයේ අඩංගු විධිවිධාන, අතුරු විධිවිධාන හා 4 වන පරිශිෂ්ඨයේ සඳහන් විධිවිධාන හා කලින් කල සිදු කරන ලද සංශෝධනයන්ට යටත්ව පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III වන ශ්‍රේණියට අයත් නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පැවැත්වීමට නියමිත බව දන්වා සිටිනු ලැබේ.

02. මෙම විභාගය යාපනය වවුනියාව මාන්කුලම යන නගරවල පැවැත්වීමට නියමිතයි. ප්‍රමාණවත් ඉල්ලුම්පත් නොලැබීම හෝ වෙනත් කරුණු පාදක කොට ගෙන විභාග මධ්‍යස්ථානයක් අවලංගු කිරීමේ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට හිමි බව දන්වා සිටින අතර ඉල්ලුම්කර ඇති නගරය පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ.

03. **සුදුසුකම්** පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධරයන් මේ දක්වා III වන ශ්‍රේණියට අදාළ මෙම විභාගය සම්පූර්ණ කර නැතිනම්. ඉහත විභාගයට අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

04. **අයදුම්පත්‍රය :-**

- අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනය වනුයේ ***17.06.2021*** වේ.
- ඉල්ලුම්පත්‍රය වනාහි මෙම චක්‍රලේඛය සමග අමුණා ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූලව සකස් කළ යුතුයි. විභාග අපේක්ෂකයන් එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලවම සකස් කරගෙන තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය**. යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුයි.
- ඉල්ලුම්පත් යොමු කරන ලිපි කවරයේ වම් පස උඩ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් හා අවශ්‍ය තොරතුරු සපුරා නැති ඉල්ලුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. **විභාග අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය:-** විභාගයට ඉදිරිපත් වන විභාග අපේක්ෂකයන් තමන් පෙනී සිටින සෑම විෂයකටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් කුමක් හෝ එකක් පිලිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ශ්‍රී ලංකා ගුවන් ගමන් බලපත්‍රය (Passport)
(iii) වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය (Driving Licence)

ඉහත සඳහන් ලියකියවිලිවලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයකුගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම අහෝසි කළ හැකිය.

06. **අයදුම්පත් :-**

- අංක 1 සිට 6 දක්වා වූ ඡේද පළමු පිටුවේ ද අනෙක් ඡේද දෙවන පිටුවේද ඇතුලත් වන පරිදි A4 ප්‍රමාණයේ කඩදාසියක පරිගණකයට මගින් අයදුම්පත්‍රය සකස් කර විභාග අපේක්ෂකගේ අත්අකුරුවලින් නිවැදිව හා පැහැදිලිව අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුයි.
- අයදුම්පත්‍රය වනාහි ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතුයි. අයදුම්පතේ ඡායා පිටපතක් හෝ පූර්ව නිශ්චිත පිටපතක් යොමු කිරීමෙන් වැළකිය යුතුයි.
- ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ සම්පූර්ණ තොරතුරු සපුරා නැති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- විභාග නිවේදනයෙන් නිකුත් කර ඇති ආදර්ශයට අනුව තම අයදුම්පත්‍ර සකස් කර තිබේද යන්න විභාග අපේක්ෂකයන් නිශ්චිත විය යුතු අතර සම්පූර්ණ කරන ලද එම අයදුම්පත්‍රයේ ඡායාපිටපතක් තම භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

## 07. විභාග ගාස්තු :-

**7.1** පළමු වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ.

**7.2** අනෙක් විභාග අපේක්ෂකයන්, තමන් පෙනී සිටින්නේ එක් විෂයයකට පමණක් නම් රුපියල් 250/-ක් ගෙවිය යුතු අතර එකකට වැඩි විෂයයන් සඳහා නම් රුපියල් 500/- ක් ද උතුරු පළාතේ පිහිටි ඕනෑම තැපැල් කන්තෝරුවකින් එම වටිනාකම ගෙවා මුදල් ඇණවුම, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත,"** යන නමට **යාපනය තැපැල් කාර්යාලයෙන්** මාරු කිරීමට පහසු වන පරිදි එම ඇණවුම ලබාගත යුතුයි.

**7.3** විභාග අපේක්ෂකයන් මුදල් ඇණවුමේ ඡායා පිටපතක් තමන් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි අතර. මෙම ගාස්තුව නැවත ගෙවනු නොලැබෙන අතර වෙනත් විභාගයක් සඳහා මෙම ගාස්තුව මාරු කර ගැනීමටද ඉඩ දෙනු නොලැබේ.

08. අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත තම තමන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළයුතුයි. අත්සන සහතික කළ ප්‍රවේශපත්‍රයක් නැති අපේක්ෂකයන්ට විභාගයට පෙනී සිටීමට අවස්ථාව දෙනු නොලැබේ. අපේක්ෂකයකුට විභාගයට දින 03 කට ප්‍රථමයෙන් හෝ ප්‍රවේශ පත්‍ර නොලැබුණේ නම් වහාම පහත සඳහන් තොරතුරු සමග උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත දැන්විය යුතුයි.

- තොරතුරු ඇතුළත් ලිපියක්
- ඉල්ලුම්පත්‍රයේ පිටපතක්
- මුදල් ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත
- ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කන්තෝරුව හා ලියාපදිංචි අංකය හා දිනය
- ප්‍රවේශපත්‍ර යොමු කිරීමට අවශ්‍ය ෆැක්ස් අංකය (Fax No).

**සටහන** :- අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම යනුවෙන් අදහස්වනුයේ ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සඳහා සුදුසුකම් සියල්ල සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

.

09. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයකුට විභාගයට ඉදිරිපත්වීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 19 වන ඡේදයට අනුකූලව කටයුතු කළ යුතු යි.

10. එමෙන්ම විභාගයෙන් සමත්වීමට නම් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් එක් විෂයයක් සඳහා අවම වශයෙන් ලකුණු *(40%)* බැගින් සෑම විෂයයන්ටම ලකුණු ලබාගත යුතුයි.

11. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ.

12. **විභාග සැලැස්ම:-** විභාග අපේක්ෂකයන් පහත සඳහන් විෂයයන් අන්තර්ගත වන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුයි.

| | විෂයය | විෂයය අංකය | ලකුණු | කාලය පැය |
|---|---|---|---|---|
| 1. | කාර්යාල ක්‍රමය | **01** | 100 | පැය 2 |
| 2. | ගිණුම් ක්‍රමය | **02** | 100 | පැය 2 |
| 3. | පරිගණක පරීක්ෂණය | **03** | 100 | පැය $1^1/_2$ |

### 12.1 කාර්යාල ක්‍රමය (විෂයය අංක *01*) :-

රජයේ කාර්යාලවල ක්‍රියාත්මක කාර්යාල ක්‍රමයන් පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ක්‍රියාකාරීව භාවිතා කිරීමේ හැකියාවල රාජකාරිය සමග සබැඳි ලියකියවිලි මැනවින් තේරුම් ගෙන පැහැදිලි සාරාංශ සටහන් මඟින් තම අදහස් රූ පරීක්ෂණයන් ඉදිරිපත් කිරීමේ හැකියාව හා නියම කරන ලද නියෝග යටතේ ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව පරීක්ෂා කරනු ලැබේ

### 12.2 ගිණුම් ක්‍රමය (විෂය අංකය 02) :-

රජයේ කාර්යාලවල පරිහරණය කරමින් සිටින ප්‍රාථමික ගිණුම් හා එම ගිණුම් පාලනය කරන පොත්වල කටයුතු පිළිබඳව දැනුම හා අවබෝධය ඇගයීම මෙයින් අපේක්ෂා කරනු ලැබේ.

### 12.3 පරිගණක පරීක්ෂණය (විෂය අංකය *03*) :-

විභාග අපේක්ෂකයකුගේ පරිගණකය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු පරීක්ෂා කිරීමේ අරමුණින් මෙය පැවැත්වීම නියමිතයි.

(i) තොරතුරු තාක්ෂණය පිළිබඳ සාරාංශය
(ii) වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය
(iii) ගොනු කළමනාකරණය
(iv) පද සැකසීම

මූලික නිපුණතා තිරයට හුරුවීම සංස්කරණය විෂයන් කෙළින් කිරීම අකුරු වර්ගයේ ශෛලියල ඡේද සැකසීම පේළි අතර හිඩැස මාරු කිරීම, ටැබ් සැකසුම විෂය සොයා ගැනීම හා විකල්පල උච්චාරණය හා ව්‍යාකරණ, නිබන්ධනය

(Thesaurus), වැඩසටහන් භාවිතය, පිටු සැකැස්ම, ලියකියවිලි මුද්‍රණය කිරීම, ලේඛණ සකස් කිරීම, විෂය වර්ගීකරණය, ගොනු කළමනාකරණය, තැපැල් ඒකාබද්ධ කිරීම, මැක්‍රෝස් සමාග වැඩ කිරීම

I. **පැතුරුම්පත** -
මූලික හැකියාවන්
නිර්මාණය
ප්‍රකාශන
වැඩසටහන් හා වේගය, ඇතුල් කිරීම හා මකා දැමීම
දත්ත වර්ග කිරීම
සිතියම් නිර්මාණය
මුද්‍රණය කිරීම
@ භාවිතය
මැක්‍රෝස් සමග වැඩ කිරීම
ගොනු කළමනාකරණය

II. **අන්තර් ජාලය** - අන්තර් ජාලය පිළිබඳ හැඳින්වීම, ජාත්‍යාන්තර ජාල පද්ධතිය, සෙවීමේ ක්‍රමය අන්තර්ජාලයේ ක්‍රියාකාරිත්වය

III. **විද්‍යුත් තැපැල (E-Mail)** - හැඳින්වීමල මූලික නිපුණතාල විද්‍යුත් තැපැල් ලබා ගැනීමල යැවීමල පිළිතාරු සැපයීමල සම්බන්ධීකරණයන් සමග කටයුතු කිරීම වාසගම් නිර්මාණය හා භාවිතයල තොරතුරු සැකසීම

**සටහන:-** උතුරු පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ ව්‍යාවස්ථා සංග්‍රහයේ ඇමුණුම 4 ඡේද 02 හි සඳහන් කරුණුවලට අනුව ජාතික අභ්‍යාශලාහී තාක්පණ පුහුණු මණ්ඩලය විසින් ප්‍රදානය කරන පරිගණක කටයුතු බලපත්‍ර සහතික ලබා ඇති නිලධරයන්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොම්පන් සභාව විසින් අනුමත පරිගණකය සම්බන්ධ උපාධියක් ලබා ඇති නිලධරයන්, තෘතියික අධ්‍යාපනය හා වෘත්තිය අධ්‍යාපන කොම්ෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතනයකින් NVQ මට්ටම 4 හෝ ඊට ඉහළ මට්ටමේ පරිගණක සහතික ලබා ඇති නිලධරයන් මෙම පරිගණක ලිඛිත පරික්ෂණයෙන් නිදහස් කරනු ලැබේ

13. මෙම චක්‍රලේඛයේ සඳහන් කර ඇති තොරතුරු ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / කාර්යාලයේ සේවය කරන අදාල නිලධරයන් වෙත දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබෙන අතර මෙම තොරතුරු උතුරු පළාත් සභාවේ www.np.gov.lk යන අන්තර්ජාල ලිපිනයෙන් ද ලබා ගත හැකිය.

**සැලකිල්ලට ගතයුතුයි :-** අදාළ විභාග දැන්වීම මගින් විධිවිධාන නොකරන ලද කිසියම් කරුණක් වෙතොත් එම කරුණ සම්බන්ධයෙන් පලාත් රාජ්‍ය සේවා කොම්පන් සභාවේ ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණය අවසන් තීරණය වන අතර දෙමළ හා සිංහල මාධ්‍යයන් අතර යම් කිසි නොගැළපීමක් දක්නට ලැබේ නම් එවැනි අවස්ථාවක දෙමළ භාෂා මධ්‍යයට ප්‍රමුඛ ස්ථානය දී කටයුතු කළ යුතුයි.

*එස්. තිරුවාකරන්,*
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොම්පන් සභාව,
උතුරු පළාත.